# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1914/8 - 2015 මැයි මස 12 වැනි අඟහරුවාදා - 2015.05.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

කාර්ය පටිපාටික රීති

I වැනි කාණ්ඩය

*200 වැනි වගන්තිය සංශෝධනය කිරීම*

අංක 1589/30 හා 2009.02.20 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති I වන කාණ්ඩයේ 200 වැනි වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලබේ.

200. දෙපාර්තමේන්තුවක හෝ අමාත්‍යාංශයක හෝ පිහිටුවනු ලබන වාර්ෂික ස්ථාන මාරු කමිටුවක සංයුතිය පහත සඳහන් පරිදි වන්නේ ය.

(i) අදාළ දෙපාර්තමේන්තුවේ හෝ අමාත්‍යාංශයේ හෝ නියෝජ්‍ය ප්‍රධානියෙක් හෝ එවැනි තනතුරක් නොමැති අවස්ථාවකදී එම දෙපාර්තමේන්තුවේ හෝ අමාත්‍යාංශයේ හෝ ජ්‍යෙෂ්ඨතම සහකාර ප්‍රධානියෙක් ;

(ii) අදාළ දෙපාර්තමේන්තුවේ හෝ අමාත්‍යාංශයේ හෝ ආයතන කටයුතු භාර ජ්‍යෙෂ්ඨ රජයේ නිලධරයෙක් ;

(iii) වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ විෂය පථයට අයත් වන නිලධර කණ්ඩායම් වලට හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගෙන් අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත සෑම වෘත්තීය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් ;

හෝ

පූර්ණකාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදා හැර ඇති සෑම වෘත්තීය සංගමයකම නම් කළ නියෝජිතයෙක්.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ටී. එම්. එල්. සී. සේනාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2015 අප්‍රේල් මස 28 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.

05 -686

1A - PG 2460 — 206 (2015/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*